# අපේ දැක්ම

## ප්‍රතිපත්ති මාලාව

ජනතා විමුක්ති පෙරමුණ

# අපේ දැක්ම

## ප්‍රතිපත්ති මාලාව

# අපේ දැක්ම

## ප්‍රතිපත්ති මාලාව

ජනතා විමුක්ති පෙරමුණේ 07වන ජාතික මහ සමුළුව
විසින් සම්මත කරන ලද ප්‍රතිපත්ති මාලාව

නියමුවා ප්‍රකාශන

# අපේ දැක්ම

## ප්‍රතිපත්ති මාලාව

© නියමුවා ප්‍රකාශන
ISBN 978-955-8696-34-7

පළමු මුද්‍රණය - 2014 පෙබරවාරි

**මුද්‍රණය:**
ප්‍රින්ටෙල් ප්‍රයිවට් ලිමිටඩ්
21/11,
04 වෙනි පටුමග,
අරලිය උයන,
දෙපානම,
පන්නිපිටිය.

**ප්‍රකාශනය:**
නියමුවා ප්‍රකාශන
464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**විමසීම්:**
දුරකථන:- +94112785612
ෆැක්ස්:- +94112786050
ඊ-මේල්:- niyamuwa@jvpsrilanka.com
වෙබ්:- www.jvpsrilanka.com
ආධාරය රු. 50.00

# වචනයක්

අතීතයේ ආසියාතික නිෂ්පාදන රටාව සහිත සමාජයක් තුළ පැවති ලංකාවට ධනවාදය හඳුන්වා දෙනු ලැබූයේ 1815 දී මුළු ලංකාවම තම යටත්විජිතයක් බවට පත් කර ගත් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසිනි. සියවස් එකහමාරකට ආසන්න ඔවුන්ගේ යටත්විජිත සූරාකෑම තුළ එහි අතුරු ඵලයක් ලෙස ලංකාව තුළ ධනවාදය ස්ථාපිත වූ අතර එම ධනවාදය උපතින්ම බෙලහීන, පසුගාමී, අංග විකල ධනපති ක්‍රමයක් විය.

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනයෙන් මිදී 2014 පෙබරවාරි 04 දාට වසර 66ක් පිරේ. යටත්විජිත පාලනයෙන් මිදුනද ගෙවුණු වසර 66 පුරා ලංකාව පැවතියේ, නව යටත්විජිතයක් ලෙසය. මේ වන විට ශ්‍රී ලංකාව නව ලිබරල් ධනවාදයේ ගොදුරක් බවටද පත්ව තිබේ. එහි ප්‍රතිඵලය වී ඇත්තේ, ලංකාව මේ වනවිට දැවැන්ත සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික පිරිහීමකට ලක්ව තිබීමය. ඒ තුළ සියලු ජන කොටස් පීඩාවට හා වේදනාවට ලක්ව අපේක්ෂාභංගත්වයට පත්ව සිටී.

ගෙවුණු වසර 66ක කාලය තුළ රට සංවර්ධනය කරන බවට, ජනතාවගේ ප්‍රශ්න විසඳා 'සුබ අනාගතයක්' නිර්මාණය කරන බවට

විවිධ පොරොන්දු දී මාරුවෙන් මාරුවට බලයට පැමිණි ධනේශ්වර පාලක කණ්ඩායම් රටත් ජනතාවත් රැගෙනවිත් තිබෙන්නේ විශාල අගාධයක් වෙතය.

ලංකාවේ ආර්ථිකය මේ වනවිට මුළුමනින්ම පාහේ රඳා පවතින්නේ, විදේශ හා දේශීය ණය මත හා බදු මතය. 2013 නොවැම්බර් වන විට ලංකාවේ නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය රුඃ බිලියන 6490ක් විය. එහි ප්‍රතිඵලය වී තිබෙන්නේ, සෑම වසරකම රුඃ බිලියන 1000කට වැඩි මුදලක් හෙවත් ලංකාවේ වසරක රාජ්‍ය ආදායමට සමාන මුදලක් ණය සඳහා වාරික හා පොලී ලෙස ගෙවීමට රටට සිදුව තිබීමය. නිෂ්පාදන ආර්ථිකයක් නොමැති තත්වයක් තුළ පොලී හා වාරික ගෙවීමට නැවත ණය ගැනීමටම සිදුව තිබීමෙන් ලංකාව ණය උගුලක සිරවී ඇත. මේ තත්වය තුළ ආණ්ඩුවේ නාස්තිකාර වියදම්වල බර මෙන්ම ණය ගෙවීමේ බරද පැටවී ඇත්තේ, අමාරුවෙන් ජීවත්වන ජනතාව මතය. අනෙක් අතට ලංකාවේ ආදායම් බෙදීයාමේ විෂමතාවය දිනෙන් දිනම වැඩිවීම මගින්ද පොදු ජනතාව පීඩාවට පත්ව සිටිති. ලංකාවේ ජනගහනයෙන් පොහොසත්ම පවුල් 20% ලංකාවේ ජාතික ආදායමෙන් 54%ක් අත්පත් කර ගනිද්දී ජනගහනයෙන් දුප්පත්ම පවුල් 20% ජාතික ආදායමෙන් අත්පත් කර ගන්නේ 04% ක් තරම් සුළු ප්‍රමාණයකි. මෙය කිසිසේත්ම සාධාරණ නොවේ.

ආණ්ඩුව තවමත් තම ආර්ථික ප්‍රතිපත්තිය ලෙස තෝරාගෙන ඇත්තේ, නිෂ්පාදනය නොව ආසියාවේ මැද පංතිය ඉලක්ක කරගත් සංචාරක ව්‍යාපාරය මත පදනම්වූ ආර්ථිකයකි. කැසිනෝ සූදුව, සුරාව, ගණිකා වෘත්තිය සහිත දුරාචාර ආර්ථිකයකි. පවුල්වාදය වටා ගොඩනැගුණු ආර්ථිකයකි. ඒ සමග ආණ්ඩුවේ නාස්තිය, දූෂණය, හොරකම, මූල්‍ය වංචා හා රාජ්‍ය ආයතනවල පාඩුවද රට ආර්ථික වශයෙන් පත්කොට ඇත්තේ, දැවැන්ත විනාශයකටය. ඒ තුළ දේශීය ව්‍යාපාරිකයාද, කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයාද, ගොවියාද, කම්කරුවාද පොදු ජනයාද පීඩාවට පත්ව සිටිති.

ඒ අතර ආර්ථික අර්බුදයේ හා මෙම නිදහස් වෙළඳපොළ ආර්ථික ප්‍රතිපත්තියේම තර්කානුකූල ප්‍රතිඵලය ලෙස රට තුළ වේගයෙන් පැතිරෙමින් පවතින අපරාධ, මත්කුඩු, මත්පැන් හා සමාජ විරෝධී ක්‍රියා හේතුවෙන් සහ ඒවා බොහොමයකට රාජ්‍ය බලය හොබවන අය සම්බන්ධ වීම හේතුවෙන් සමාජය විශාල පිරිහීමකට ලක්ව, පොදු ජනතාව එහි ගොදුරු බවට පත්ව සිටිති. නීතිය, සමාජ සම්ප්‍රදායන් හා ආචාරධර්ම නොසලකන දේශපාලන බලය නිසා නීතිය රැකිය යුතු ධනේශ්වර ආයතන වන පොලීසිය, අධිකරණය හා අල්ලස් කොමිසම ඇතුළු රාජ්‍ය ආයතන සියල්ලද පිරිහී තිබේ. සමාජ සාධාරණත්වය, ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය හා වගවීම අරුත් රහිත වචන පමණක් බවට පත්ව තිබේ.

අනෙක් අතට ලංකාවේ ජාතික සමගිය ගොඩනැගීමට වත්මන් පාලනය අසමත් වීම නිසාත්, ජනතාවගේ අයිතීන් ස්ථාපිත කිරීමට හා මානව හිමිකම් රැකීමට අසමත් වීම නිසාත් අධිරාජ්‍යවාදී උපායමාර්ගය පරාජය කරනු වෙනුවට බලය වෙනුවෙන් එයට යටත් වීම නිසාත් ජාතික හා ආගමික විරසකභාවයන් වැඩිවෙමින් පවතින අතර විදේශ මැදිහත්වීම්වල අනතුරද මතුව තිබේ.

මේ සියල්ල එක්කොට ගත්විට පෙනෙන්නේ ආර්ථික වශයෙන් බංකොලොත් වූ, සමාජීය වශයෙන් පිරිහුණු, නීතිය වල්වැදුණු, පවුල් බලය රජවුණු, යුක්තිය සාධාරණය නොපවතින, ප්‍රජාතන්ත්‍රවාදය මිය යමින් පවතින, ජාතික හා ආගමික අසමගිය වර්ධනය වන රටක් බවට ලංකාව පත්ව ඇති බවය.

මෙම තත්වය නිසා පීඩාවට පත් පොදු ජනතාව තුළින්ද, විවිධ ජන කණ්ඩායම් වෙතින්ද, ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය අගයන ප්‍රගතිශීලී හා දේශප්‍රේමී බලවේග තුළින්ද රටේ වෙනසක් පිළිබඳ වුවමනාව මතුවෙමින් තිබේ. අර්බුදයට පත් ලාංකේය සමාජය වෙනසක් ඉල්ලා හඬනගමින් තිබේ.

සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික වශයෙන් අර්බුදයට පත්ව ඇති ලාංකේය සමාජයට අවැසි වෙනස කුමක්ද? එය හුදු පුද්ගල වෙනසක් නොවේ. එය හුදු පාලනයේ සරල වෙනසක්ද නොවේ. ඒ වෙනුවට පවතින සමාජ, ආර්ථික, දේශපාලන දේහයේ ගැඹුරු හා පුළුල් වෙනසක් අවශ්‍ය වේ.

වර්තමානයේ ලංකාව මුහුණදී ඇති මෙම අර්බුදයට ඇත්තේ, එක සැබෑ විසඳුමක් පමණි. එනම් මෙම වැරදි සමාජය එහි ගැඹුරින්ම වෙනස් කරන නව සමාජ පරිවර්තනයකි. සැබෑ ආර්ථික සංවර්ධනය, සමාජ සාධාරණත්වය, ප්‍රජාතන්ත්‍රවාදය, ජාතික සමගිය, සැබෑ ජාතික නිදහස, පුද්ගල නිදහස, හා යහපාලනය ගොඩනැගිය හැකි සමාජයකි. එනම් වර්තමානයේ අපේ රටට ගැලපෙන, **නවීන සමාජවාදී** ප්‍රතිපත්ති මත පදනම් වූ, ජනතාවාදී පාලනයක් සහිත නව සමාජයකි. එවන් සමාජයක් ගොඩනැගිය හැක්කේ බොරු පොරොන්දුවලින් නොව පැහැදිලි හා ස්ථිර ප්‍රතිපත්ති මාලාවක් ක්‍රියාත්මක කිරීමෙනි. **නවීන සමාජවාදී** පාලනයක් සඳහාවූ දැක්මක් හා ප්‍රතිපත්ති අනුව රට ගොඩනැගීම සඳහා, ප්‍රධාන කරුණු පහක් ඔස්සේ සකස් කළ **"අපේ දැක්ම"** ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිපත්ති මාලාව මෙසේ ඉදිරිපත් කරමු.

# ජනතාවාදී
# පාලනයක්

## අප රටට ඇවැසි කුමන වර්ගයේ පාලනයක් ද?

ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් දශක භාගයකට වරක් මුදල් හා බලය යොදාගෙන ජනතා මතය විකෘති කර ඡන්ද ලබා ගන්නා කණ්ඩායමක් බලයට පත් කරගෙන, ජනතාව ප්‍රේක්ෂකයන් කර ඊළඟ මැතිවරණය තෙක් 'එම කණ්ඩායමට' රට නතු කරන පාලනයක් ද?

එම පාලනය රටේ ව්‍යවස්ථාදායකයේ නීති පැනවීමේ සිට පාසලට දරුවකු ඇතුළු කිරීම දක්වා වූ සෑම සමාජ ආයතනයකටම, ක්‍රියාවලියකටම දේශපාලනඥයා මැදිහත් වන, ඒ නිසාම සියලු ආයතන හා කළමනාකරණ පද්ධතීන් බිඳ වැටුණු, දේශපාලනඥයා පමණක් එකම ආයතනය හා ක්‍රියාකාරීත්වය වූ පාලනයක් ද?

එම පාලනය රටේ ආර්ථිකය හා සමාජය ධනය, බලය හෝ වෙනත් සාධකයන් මත ගොඩනැඟුණු, වරප්‍රසාද ලත් කුඩා කණ්ඩායම් විසින් මෙහෙයවන, එම කණ්ඩායම් විසින් පමණක් ආර්ථික හා සමාජ ප්‍රතිලාභ, වරප්‍රසාද භුක්ති විඳින, සාමාන්‍ය ජනතාව හා වරප්‍රසාද නොලත් ජන කණ්ඩායම් පීඩාවට පත්කරනු ලබන පාලනයක් ද?

එම පාලනය සමාජ ජීවිතයේ එකම දර්ශකය හා දර්ශනය ලාභය, මුදල් හා වැඩිම භාණ්ඩ හා සේවා ප්‍රමාණයක් භුක්ති විඳීම මත පදනම්ව මුදල් සෙවීමට සමාජය උසිගන්වන අධිපරිභෝජනවාදයෙන් ජනතාව මංමුළා කරන පාලනයක් ද?

එම පාලනය සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ යන සියලු ජන කොටස් නමට පමණක් ශ්‍රීලාංකික යැයි හැඳින්වෙන, ජාතික හා ආගමික ජන කොටස් වැඩි වැඩියෙන්

එකිනෙකාගෙන් වෙන් කරන, කල්ලි ගැහෙන ජාතික හා ආගමික වශයෙන් තීව්‍ර ලෙස බෙදුණු සමාජයක්ද?

අප රට පසුගිය 66 වසර තුළ ගොඩනඟන ලද සෑම පාලනයක් තුළම ඒවායේ ඇති වර්ණය හා හැඩය වැනි සරල වෙනස්කම් කුමක් වුවද, ඉහතින් සඳහන් කළ ගැඹුරු දුර්වලතාවලින් යුක්ත විය. එම පාලනයන් තුළ ගොඩනැගුණු ආර්ථික, සමාජ දේහය ව්‍යාජ හා නරුම එකක් විය. එබැවින් ජනතා විමුක්ති පෙරමුණේ අප රටට ඇවැසි ජනතාවාදී පාලනයක් ලෙස දකින්නේ, අප රට අනාගතයට ගෙන යා හැකි, මිනිසකු විසින් මිනිසකු සූරා නොකන, ජාතියක් විසින් තවත් ජාතියක් පීඩාවට පත් නොකරන, ආර්ථික සමෘද්ධියෙන් යුත් උසස් මිනිස් සමාජයක්, එනම් **නවීන සමාජවාදී** සමාජයක් ගොඩනැඟීම ඉලක්ක කර ගනිමින්, ඒ සඳහා පූර්ව පදනම සකස් කරන ජනතාවාදී පාලනයකි.

**සමානාත්මතාවය, ප්‍රජාතන්ත්‍රවාදය, සාධාරණත්වය, පුද්ගල නිදහස හා ආරක්ෂාව** සහ **සහජීවනය** යන කුළුණු පහ මත ජනතාවාදී පාලනය ගොඩනැංවේ. එනම්, ඉහළ සිට පහළට කෙරෙන විධානයේ පාලනයක් වෙනුවට නීතියේ හා සාම්ප්‍රදායේ පාලනයක්ද, දේශපාලනය එකම ආයතනය වූ ක්‍රමය වෙනුවට ශක්තිමත් ස්වාධීන ආයතන පද්ධතියක්ද, වරප්‍රසාදලාභීන්ගේ පාලනයක් වෙනුවට සැබෑ බහුතරයේ පාලනයක්ද, පරිභෝජනවාදී සමාජයක් වෙනුවට පුරවැසි සමාජයක්ද, ජාතිකත්වයන් එකිනෙකාගෙන් දුරස් කරන පාලනයක් වෙනුවට ජාතික සමගිය හා සහජීවනය මත පදනම් වූ පාලනයක්ද ගොඩනැඟීමයි. ඒ සඳහා වූ රාජ්‍ය ව්‍යුහයක් සැකසීමයි.

## 01. රාජ්‍ය ව්‍යුහය

ශ්‍රී ලාංකේය සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ඇතුළු සියලු පොදු ජනතාවගේ නිදහස, සමානාත්මතාවය හා සහෝදරත්වය සුරැකෙන ආකාරයේ රාජ්‍ය බලයක් හා රාජ්‍ය ක්‍රියාකාරිත්වයක් ස්ථාපිත කෙරේ. ඒ අනුව පවතින රාජ්‍ය බලය හා රාජ්‍ය ක්‍රියාකාරිත්වය තීරණාත්මක ලෙස වෙනස් කිරීම උදෙසා පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නවා ඇත.

### රාජ්‍ය බලය

පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවට ජනතාව ඉදිරිපත් කරන යෝජනා හා අදහස් සැලකිල්ලට ගෙන කෙටුම්පත් කෙරෙන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ජනමත විචාරණයක් මගින් සම්මත කෙරේ. එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්

- ජනතා පරමාධිපත්‍යය ආරක්‍ෂා කෙරේ.
- විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කෙරේ.
- පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ස්ථාපිත කෙරේ.
- පාර්ලිමේන්තුවේ නිලකාලය වසර පහකට සීමා කෙරෙන අතර එම නිල කාලය අවසන් වීමෙන් පසු තෙමසක් ඉක්ම යාමට පෙර මහ මැතිවරණය පැවැත්වේ.
- ස්වාධීන මැතිවරණ කොමිසම, ස්වාධීන පොලිස් කොමිසම, ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම, ස්වාධීන ජනමාධ්‍ය කොමිසම හා ස්වාධීන අධිකරණ සේවා කොමිසම ස්ථාපිත කෙරෙන අතර එම කොමිෂන් සභා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කෙරේ.

- පක්ෂය මාරු කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මන්ත්‍රීධූර අහෝසි කෙරේ.

- ඇමති මණ්ඩලය 25කට සීමා කෙරේ.

- ත්‍රස්තවාදය වැළැක්වීම් පනත ඇතුළු මර්දන අණ පනත් අහෝසි කෙරේ.

- පළාත් සභා වෙනුවට ජනතා සභා පිහිටුවීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කෙරේ.

**රාජ්‍ය ක්‍රියාකාරිත්වය**

- ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් සභාවක් පිහිටුවනු ලබන අතර එයට දේශපාලනඥයන්ගෙන්ද විෂයයන් හා වෘත්තීන් පිළිබඳ විශේෂඥයන්ගෙන්ද උපදෙස් ලබා ගැනීමට කටයුතු කෙරේ.

- රාජ්‍ය ආයතන ඇතළු මහජනතාවට සේවා සපයන ආයතනවලින් ජනතා සේවය නිවැරදිව ඉටු නොවන අවස්ථාවලදී ඒ පිළිබඳව වහා පරීකෂා කර, පුරවැසියන්ගේ අයිතිය ආරකෂා වන සේ සාධාරණය ඉටු කිරීමට විශේෂ පරීක්ෂණ ආයතනයක් ස්ථාපිත කෙරේ.

## 02. මූලික අයිතීන්

2.1 සියලු පුරවැසියන්ට දැනට පවතින මූලික අයිතිවාසිකම්ද ඇතුළත්ව සෞඛ්‍යය, අධ්‍යාපනය, රැකියා හා නිවාස ලබා ගැනීම මූලික අයිතීන් ලෙස පිළිගන්නා අතර රජය විසින් ඒ මූලික අයිතිය උල්ලංඝනය කරන අවස්ථාවලදී රජයට එරෙහිව අධිකරණය ඉදිරියට යාමට පුරවැසියන්ට ඇති අයිතිය තහවුරු කෙරේ.

## 03. ජාතික ආරක්ෂාව

- ශ්‍රී ලාංකේය භූමිය, ශ්‍රී ලංකාවට අයිති මුහුදු සීමාව හා ගුවන ආරක්ෂා කෙරේ.
- ත්‍රිවිධ හමුදා හා පොලීසිය දේශපාලන බලපෑමෙන් නිදහස් කෙරේ.
- ත්‍රිවිධ හමුදාවල හා පොලීසියේ සේවය කරන සියලු දෙනා තුළ පවතින පීඩාකාරී තත්වය හා අප්‍රසන්න වටපිටාව අහෝසි කිරීම සඳහා වහාම පියවර ගනු ලැබේ.

## 04. ජාතික සමගිය

සියලු ජන කොටස්වලට ප්‍රජාතන්ත්‍රවාදය හා සමානතා පදනම මත අයිතීන් තහවුරු කිරීම අරමුණු කොට සම්පාදනය කරන ලද "ජාතික ගැටලුව විසඳීම සඳහා ප්‍රවේශය" මගින් ඉදිරිපත් කළ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කෙරේ.

## 05. විදේශ ප්‍රතිපත්තිය

- ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය ආරක්ෂා කරන, අධිරාජ්‍ය විරෝධී යටත්විජිත විරෝධී මෙන්ම සාමකාමී සහජීවනය හා අන්‍යොන්‍ය සහයෝගය මත පදනම්වූ නව විදේශ ප්‍රතිපත්තියක් සම්පාදනය කරනු ලැබේ.
- විදේශ සේවය ආයතනගත වෙනස්කම්වලට භාජනය කෙරෙන අතර අකාර්යක්ෂමතාවය, දේශපාලන පත්වීම්, නාස්තිය වළක්වා, විදේශ සේවයේ වැදගත්බව හා වගකීම ආරක්ෂා කෙරෙන පදනමක පිහිටා විදේශ කටයුතු ප්‍රතිසංවිධානය කෙරේ.

# උසස්
# මානව සම්පතක්

අප රටේ සංවර්ධන උපායමාර්ගයේ කේන්ද්‍රය කරගත යුත්තේ මානව සම්පත් සංවර්ධනයයි.

1948 සිට දශක 07කට කිට්ටු කාලයක් පුරා රට වැරදි හා අරාජික ආර්ථික උපායමාර්ගයක ගමන් කරවීම නිසා ලෝක හා කලාපයීය ආර්ථිකයන් තුළ ඒ ඒ මොහොතේදී අත්පත්කරගත යුතුව තිබූ කාර්මික හා කෘෂිකාර්මික නිෂ්පාදනයේ ජයග්‍රාහී අවස්ථා අහිමි වී ඇත.

අනාගත ලෝකය තුළ උසස් මට්ටමේ ශිල්පීය පදනමක් මත භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සංවිධානය කෙරෙන තත්වයක් තුළ ශ්‍රී ලංකාවටද ගෝලීය වෙළඳපොළට මෙන්ම දේශීය වෙළඳපොළට භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේදී ඉහළ මට්ටමේ තාක්ෂණවේදීන් හා වෘත්තීයවේදීන් විශාල වශයෙන් අවශ්‍ය වන්නේය.

රටේ ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන උපාය මාර්ගය උසස් මානව සම්පතක් රට තුළ ගොඩනැගීම වූ විට රටට අදාළව යොදාගනු ලබන අධ්‍යාපනය, විද්‍යාත්මක පර්යේෂණ හා වෘත්තීය පුහුණුව, ක්‍රීඩාව, සෞඛ්‍යය ආදී ක්ෂේත්‍ර පුළුල් හා නවීකරණ පදනමකින් පෙරළිකාර වෙනස්කම්වලට ලක්විය යුතුය. ඒ සඳහා,

## 01. අධ්‍යාපනය

- අධ්‍යාපනය මුළුමනින්ම රජයේ වගකීමක් කරනු ලැබේ. අධ්‍යාපනයේ සම අයිතිය මූලික මානව අයිතිවාසිකමක් ලෙස ව්‍යවස්ථාවෙන් සහතික කෙරේ. සෑම පුද්ගලයෙකුටම අඛණ්ඩ අධ්‍යාපනයක්, පුහුණුවක්, උසස් අධ්‍යාපනයක් ලබාදීම රජය මගින් තහවුරු කෙරේ.

- පෙර පාසැලේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා සියලුම අධ්‍යාපන අවස්ථා නොමිලේ ලබාදීම ව්‍යවස්ථාවෙන් සහතික කෙරේ.

- පළාත් සභා පාසැල්, ජාතික පාසල්, සපිරි පාසල්, නවෝද්‍යා පාසල් ආදී විවිධ බෙදීම් අහෝසි කෙරෙන අතර පාසැල්, උසස් අධ්‍යාපන ආයතන, වෘත්තීය අධ්‍යාපනය යන සියල්ල මෙහෙයවීම රජයේ වගකීමක් බවට පත් කෙරේ. ඒ ඒ ක්ෂේත්‍රවල විෂය ප්‍රවීණයන්ගෙන් සැදුම් ලත් 'රාජ්‍ය අධ්‍යාපන කොමිෂන් සභාවක්' මගින් අධ්‍යාපනය මෙහෙයවනු ලැබේ.

- අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් අවම වශයෙන් 6%ක් වෙන්කරනු ලැබේ.

- පෙරපාසැල් අධ්‍යාපනය පළාත් පාලන ආයතනවල විෂයයක් බවට පත් කෙරේ. එහි විෂය සකස් කිරීම පුහුණු උපාධිධාරී ගුරුවරුන් ලබාදීම, අධීක්ෂණය 'රාජ්‍ය අධ්‍යාපන කොමිෂන් සභාව' මගින් සිදු කෙරේ.

- වයස අවුරුදු 05 සිට 12 දක්වා අනිවාර්ය ප්‍රාථමික අධ්‍යාපනය, වයස අවුරුදු 13 සිට 16 දක්වා අනිවාර්ය ද්විතීයික අධ්‍යාපනය ලෙස ක්‍රියාත්මක කෙරේ.

- දියුණු මානව සම්පතක් බිහිකිරීම අරමුණු කරගත් විශ්වවිද්‍යාල, උසස් විද්‍යාල (University Colleges) සහ වෘත්තීය විද්‍යාල පද්ධතියක් සංවර්ධනය කිරීම ජාතික ප්‍රමුඛතාවයක් බවට පත්කරනු ලැබේ.

- පවතින කඩඉම් විභාග ක්‍රමය අහෝසි කර දරුවන්ගේ හැකියාවන් අනුව අනාගත වෘත්තීන් තෝරා ගැනීමට හැකිවන නව විභාග ක්‍රමයක් ඇති කෙරේ.

- පශ්චාත් උපාධි ලබාදීම සඳහා දැනට පවතින අක්‍රමවත් විධික්‍රම සියල්ල මධ්‍යගත කොට ජාතික පශ්චාත් උපාධි ආයතනයක් පිහිටුවනු ලැබේ.

## 02. සෞඛ්‍යය

- සෞඛ්‍යය මූලික මානව අයිතියක් ලෙස පිළිගැනේ.

- මානසික, කායික සහ සමාජයීය සුවතාවයෙන් යුක්තව ජීවත්වීම සෑම පුරවැසියෙකුගේම අයිතියක් ලෙස පිළිගැනේ.

- ශ්‍රී ලාංකේය ජනතාව ලෝකයේ වඩාත්ම සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බවට පත්කිරීමේ අරමුණින් රාජ්‍ය ප්‍රතිපත්ති යාන්ත්‍රණය සකස් කෙරේ.

- රෝග නිවාරණය, ප්‍රතිකාරය හා පුනරුත්ථාපනය ඇතුළු සෞඛ්‍යය සේවාවේ සියලු අංශ ප්‍රමාණාත්මක වශයෙන් හා ගුණාත්මක වශයෙන් සංවර්ධනය කෙරේ.

- රජයෙන් පවත්වාගෙන යන සෞඛ්‍ය සේවාවේ සේවය ලබා ගැනීමේදී යම් පුරවැසියෙකුගේ ආර්ථික, සමාජමය දුෂ්කරතා බාධාවක් නොවනු පිණිස ඇලෝපති, හෝමියෝපති, ආයුර්වේද, දේශීය වෛද්‍ය ක්‍රම ඒකාබද්ධ වූ රාජ්‍ය සෞඛ්‍ය සේවාව ප්‍රමාණවත් පරිදි ප්‍රසාරණය කෙරේ.(Universal Access to helth care)

- මාතෘ, ළමා සහ නිවාරණ සෞඛ්‍ය සේවාවන්ට මූලිකත්වය ලබාදෙන අතර සෑම පවුල් ඒකකයක්ම අත්‍යවශ්‍ය සෞඛ්‍ය අධ්‍යාපනයෙන් සන්නද්ධ කෙරේ.

- මැලේරියා, බරවා, ජලභීතිකාව, පෝෂණ ඌණතා මුළුමනින් තුරන් කිරීමටත් ක්ෂය රෝගය, මී උණ, ඩෙංගු, වකුගඩු රෝග වසංගතය සහ දියවැඩියාව, පිළිකා වැනි බෝ නොවන රෝග අවම කිරීම සඳහා වූ ප්‍රතිපත්තිමය තීරණ සහ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කෙරේ.

- ප්‍රමිතිය සහතික කළ අත්‍යාවශ්‍ය ඖෂධ හා උපකරණ හිඟයකින් තොරව සෞඛ්‍ය සේවාවට ලබා දීමත් සබුද්ධිකව භාවිතා කිරීමත් සහතික වනු පිණිස ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් කඩිනමින් ක්‍රියාත්මක කෙරේ.

- සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ වෘත්තීය තෘප්තිය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පිණිස දැනුම, කුසලතා යාවත්කාලීන කිරීමටත් ඔවුන් මුහුණ දෙන සාධාරණ දුෂ්කරතාවලට විසඳුම් ලබා දීමටත් කටයුතු කෙරේ.

- ජනතාවගේ සෞඛ්‍යය ව්‍යාපාරික අවශ්‍යතා වෙනුවෙන් සූරාකෑමට ඉඩ නොදෙන අතර ස්වකැමැත්තෙන් පෞද්ගලික සෞඛ්‍ය සේවාවට යොමුවන පුද්ගලයින්ගේ අයිතියට ගරු කිරීමක් ලෙස එම අංශය පවත්වාගෙන යෑමට ඉඩ ලැබුණද ඒවායින් ලබා දෙන සේවාවේ ගුණාත්මක බව පිළිබඳව රජයට සහතික විය හැකි ආකාරයේ අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කෙරේ.

## 03. ක්‍රීඩා

- නීරෝගී, විනයගරුක හා සමාජශීලී මනා පෞරුෂයකින් යුත් පුරවැසියන් බිහි කිරීමේලා හා ජාතික සංහිඳියාව ගොඩ නැගීමේලා ක්‍රීඩා ක්ෂේත්‍රයේ නව පරිවර්තනයක් සිදුකෙරේ.

- සියලුම ක්‍රීඩාවලට සමානත්වය ලැබෙන පරිදි ක්‍රීඩා දියුණු කිරීමත්, පවත්වාගෙන යාමත් රජයේ වගකීමක් බවට පත්වන අතර ක්‍රීඩා නගාසිටුවීම සඳහා වූ ඉලක්කයක් සහිතව ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩපිළිවෙළක් සකස් කෙරේ.

- ක්‍රීඩා ක්ෂේත්‍රය නව පරිපාලන නීති හා විනය පද්ධතියක් මත ප්‍රතිසංවිධානය කෙරේ.

- ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැක බලා ගැනීම, රක්ෂණය කිරීම, ඔවුන්ට අවශ්‍ය මූල්‍ය හා භෞතික පහසුකම් ලබාදීමද, වෘත්තීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට වැටුප් හා වෙනත් දීමනාද, නිවාස පහසුකම්ද, ක්‍රීඩා උපකරණද සැපයෙන අතර ක්‍රීඩාවෙන් විශ්‍රාම ගැනීමෙන් පසු ඔවුනට විශ්‍රාම වැටුපක් ලබාදීමටද කටයුතු කෙරේ.

- ග්‍රාමීය ප්‍රදේශවලට අවශ්‍ය ක්‍රීඩා පහසුකම් හා ක්‍රීඩා උපදේශකයන් ලබාදීම හා පාසැල් මට්ටමේ සිට දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හැකියාවන් හඳුනාගෙන ඔවුන් ජාතික හා ජාත්‍යන්තර මට්ටමට ගොඩනැගීමට කටයුතු කෙරේ.

## 04. විද්‍යා හා තාක්ෂණ

- තොරතුරු තාක්ෂණය හා අන්තර් ජාලය පිළිබඳ අවබෝධය ලබාගැනීම හා ඒවා භාවිතය පුරවැසියාගේ අයිතියක් ලෙස පිළිගනු ලැබේ.

- සියලු පුරවැසියන්ට නොමිලේ අන්තර්ජාල පහසුකම් සපයනු ලැබේ.

- විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ කටයුතු සඳහා රාජ්‍ය මැදිහත්වීම පුළුල් කෙරෙන අතර ඒ සඳහා දළ ජාතික නිෂ්පාදනයෙන් 1%ක් යෙදෙවෙන ආකාරයට රාජ්‍ය හා පුද්ගලික ආයතන මෙහෙයවනු ලැබේ.

# නවීකරණය හා
# කාර්මීකරණය වූ රටක්

**නවීන සමාජවාදී** රාජ්‍යයක මිනිස් ජීවිත හැකි තරම් සරල හා පහසු එකක් විය යුතුය. මේ අනුව පොදුමහත් ජනතාවගේ භාණ්ඩ හා සේවා පරිභෝජනය කිරීමේදීත්, නෛතික හා පරිපාලන අංශවලට සම්බන්ධ කටයුතුවලදීත් ඒවා සරල මෙන්ම කාලය හා ශ්‍රමය අනවශ්‍ය පරිදි නාස්ති නොකෙරෙන පරිදි සංවිධානය කළ යුතුය. එය කළ හැක්කේ ලොව පුරා විවිධ ජාතීන් විසින් උකහාගෙන ඇති දියුණු හා සරල පරිපාලන ක්‍රමවේද, කළමනාකරණ ක්‍රමවේද හා අවශ්‍ය හා ගැලපෙන පරිදි තාක්ෂණය යොදා ගැනීමත් සෑම විටම සෑම ක්ෂේත්‍රයක්ම යාවත්කාලීන කිරීමේ නොනිම් ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමෙන් පමණි. මේ සඳහා විද්‍යුත් ආණ්ඩුකරණය(e-government), විද්‍යුත් වාණිජ්‍යය (e-commerce) වැනි තාක්ෂණය මත පදනම් වූ පරිපාලන හා කළමනාකරණ ක්‍රමවලට රට යොමු කිරීමද, පරිපාලන බලය හැකිතරම් විමධ්‍යගත කිරීම තුළින්ද, යාවජීව විද්‍යා තාක්ෂණ අධ්‍යාපනය ප්‍රචලිත කිරීමද ඇතුළත් වේ. මෙම නවීකරණ ක්‍රියාවලිය සමාජ ජීවිතයේ සෑම අංශයකටම ප්‍රයෝජනවත්ව ගෙනයා හැක්කේ, රට පුළුල් කාර්මීකරණ ක්‍රියාවලියක් හරහා නිෂ්පාදන ක්‍රියාවලියත්, නිෂ්පාදන ක්‍රියාවලියට පුළුල් වන වෘත්තිකයන් හා සාමාන්‍ය ශ්‍රමිකයන් සියලු දෙනාගේම මට්ටම ඉහළ දැමීමත් මගිනි.

**නවීන සමාජවාදී** ආර්ථිකයක පදනම සකස් කළ හැක්කේ, රටේ නිෂ්පාදන ක්‍රියාවලිය පුළුල් සහ නිසි කාර්මීකරණයකට ලක් කිරීමෙන් පමණකි. ශ්‍රම බළකායෙන් 50%කටත් වඩා යැපුම් කෘෂිකර්මාන්තයේ නියුතු, ධීවර ප්‍රජාවගෙන් අති බහුතරයක් ප්‍රාථමික මට්ටමේ ධීවර කර්මාන්තයේ නියුතු රටක කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය හා අනෙකුත් කර්මාන්ත පුළුල් කාර්මීකරණයකට ලක්කළ යුතුය. **නවීන සමාජවාදී** ප්‍රතිපත්ති මත පිහිටා සිදුකරන කාර්මීකරණ ප්‍රතිපත්තියකදී එය සුදුසු තාක්ෂණය (Appropriate Technology) සහ තිරසාර සංවර්ධනය මත පදනම් වූ ප්‍රතිපත්ති මත

පදනම් වී කාර්මිකකරණ වැඩපිළිවෙළ සැලසුම් කළ යුතුය. එමගින් දේශීය හා විදේශීය තාක්ෂණික දැනුම රටේ තත්වයන්ට හොඳින්ම ගලපා ගැනීමටත්, පාරිසරික හා සමාජයීය සාධක නොසලකා සිදුකරන කාර්මීකරණයෙන් අනාගතයේ ඇතිවන විශාල පාරිසරික, සමාජයීය හා ආර්ථික හානි අවම කරගැනීමේ හැකියාවත් අප රටේ තත්වයන්ට හොඳින්ම ගැලපෙන කාර්මීකරණ මුහුණුවර ගොඩනගා ගත හැකිවීමත් මෙයින් ලැබෙන ප්‍රධාන ප්‍රතිලාභයකි.

කාර්මීකරණය මගින් නිෂ්පාදන ධාරිතාව, කාර්යක්ෂමතාවය හා ගුණාත්මක බව ඉහළ නැංවීම, නිෂ්පාදනවලට අගය එකතු කිරීම හා විවිධාංගීකරණය කළ හැකිවීම ලැබෙන සෘජු ප්‍රතිලාභයකි. එමෙන්ම දේශීය කර්මාන්තවලට අදාල යෙදවුම් හා උපකරණ නිෂ්පාදනය කිරීම තුළින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි වීමද, විද්‍යාත්මක පර්යේෂණ හා අත්හදාබැලීම් ක්ෂේත්‍ර දියුණු වීමද, රටේ ස්වභාවික හා මානව සම්පත්වලින් උසස් ප්‍රයෝජනයක් ගැනීමද සිදුවේ. එමෙන්ම රටේ යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාවලියටද පදනම හා දර්ශකය සකස් කෙරෙන්නේද මෙම කාර්මීකරණ වැඩපිළිවෙළ මතය. රටක් කාර්මීකරණය තුළින් සමාජයීය වශයෙන් ලැබෙන ඉතා ප්‍රබල වාසියක් වන්නේ, රට තුළ කාර්මික හා විද්‍යා ඥානය ප්‍රචලිත වීමත්, තාක්ෂණික වශයෙන් පුහුණු ශ්‍රමිකයන් හා වෘත්තිකයන් විශාල පිරිසක් බිහිවීමත්, ජනතාවගේ ආදායම් මට්ටම වර්ධනයත් සමස්තයක් වශයෙන් මුළුමහත් ජන සමාජයේම ජීවන මට්ටමේ සිදුවන වර්ධනයයි. එම නිසා මෙම කාර්මීකරණ වැඩපිළිවෙළට අනුව රටේ කෘෂිකර්මාන්තය, කර්මාන්ත, වෙළඳාම, යටිතල පහසුකම් සංවර්ධනය හා මානව සම්පත් සංවර්ධනය යන ක්ෂේත්‍ර මුළුමනින්ම ප්‍රතිසංවිධානය කරනු ඇත.

## 01. ආර්ථික ක්ෂේත්‍රය

- රට තුළ ක්‍රියාත්මක කෙරෙන අසාර්ථක කොල්ලකාරී විවෘත වෙළඳපොළ ආර්ථික ප්‍රතිපත්තිය වෙනුවට **නවීන සමාජවාදී** ප්‍රතිපත්ති මත පිහිටා භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට ප්‍රමුඛතාවය දෙන නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනගනු ලැබේ. ඒ සඳහා ජනතා සහභාගිත්වය ලබාගන්නා අතර ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාව අතර සාධාරණ ලෙස බෙදීයාමේ යාන්ත්‍රණයක් සකසනු ලැබේ.

- මානව සම්පතේ උසස් සංවර්ධනය ආර්ථිකයේ ප්‍රධාන උපායමාර්ගය බවට පත්කෙරේ.

- නිෂ්පාදන ආර්ථිකය ගොඩනැගීමේදී රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශයද සහභාගි කෙරේ.

- නිෂ්පාදන ආර්ථිකය ගොඩනැගීමේ කාර්යයට සහභාගි වන පෞද්ගලික අංශයට, පළමු වසර 05 තුළදී බදු නිදහසක් හා අදාල වෙනත් පහසුකම් සහතික කෙරේ.

- සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයන් දිරි ගැන්වීමට විශේෂ අවධානය යොමු කෙරේ.

- රට තුළ රැකියා අවස්ථා පුළුල්වන පරිදි හා රැකියාවල වෘත්තීයමය නිපුණත්වය ඉහළ නංවාලන පරිදි ආර්ථිකය මෙහෙයවනු ලැබේ.

## 02. කර්මාන්ත

- ආර්ථික වශයෙන් සමෘද්ධිමත් රටක් ගොඩනැගීම සඳහා කෘෂිකර්මාන්තය හා ධීවර කර්මාන්තය පුළුල් කාර්මීකරණයකට ලක්කෙරේ.

- කෘෂිකර්මාන්තය හා ධීවර කර්මාන්තය කාර්මීකරණය ඉලක්කකරගත් යෙදවුම් ආම්පන්න නිෂ්පාදනයෙහිලා කර්මාන්ත පද්ධතියක් බිහිකෙරේ.

- කාර්මීකරණයේ පළමු අදියර ලෙස දේශීය අවශ්‍යතා සපුරාලන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා කර්මාන්ත ආරම්භ කෙරේ.

- රට තුළ හා ශ්‍රී ලංකා මුහුදු සීමාව තුළ ඇති ස්වාභාවික සම්පත් පිළිබඳව පූර්ණ සමීක්ෂණයක් සිදු කෙරෙන අතර අමුද්‍රව්‍ය අපනයනය වෙනුවට නිමි භාණ්ඩ අපනයනයට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

- නව තාක්ෂණය, කළමනාකරණය හා ප්‍රාග්ධනය රටේ කාර්මීකරණ වැඩපිළිවෙළට යොදාගැනීම වෙනුවෙන් විදේශ රාජ්‍ය, ආයතන හා සමාගම් සමඟ ඒකාබද්ධ වීමට කටයුතු කෙරේ.

- කර්මාන්ත පරිපාලනයේදී නිලධාරීවාදය අහෝසි කිරීමත් සියලු කාර්ය මණ්ඩලවල සහභාගිත්වයත් අරමුණු කරගනිමින් ඔවුන් කර්මාන්ත පරිපාලනයට හවුල්කර ගැනීමටත් කටයුතු කෙරේ.

- රට කාර්මීකරණය සඳහා අත්‍යාවශ්‍ය වන රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා රසායනික කර්මාන්ත ඇතිකෙරේ.

- ප්‍රතිචක්‍රීකරණය විශේෂ හා අත්‍යාවශ්‍ය කටයුත්තක් ලෙස සලකනු ලබන අතර, යොදාගතහැකි සෑම ක්ෂේත්‍රයකදීම ප්‍රතිචක්‍රීකරණය සිදුකිරීමට තාක්ෂණික විධික්‍රම යොදා ගැනේ.

## 03. කෘෂි කර්මාන්තය

- කෘෂිකර්මාන්තය ආර්ථිකයේ ප්‍රමුඛ ක්ෂේත්‍රයක් ලෙස සලකා රට තුළ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම හා අපනයන වෙළඳපොළ ඉලක්ක කරගත් කාර්මීකරණයක් කෘෂිකර්මාන්තය තුළ ඇති කරනු ලැබේ.

- බීජවල අයිතිය ගොවිජනතාවට තහවුරු කිරීම ඉලක්කකොට ගත් බීජ පර්යේෂණ ආයතන, බීජ ගොවිපළවල් නගා සිටුවීම හා බීජ නිෂ්පාදන ගොවි ජනතා ජාලයක් ගොඩනගනු ලැබේ.

- කෘෂි යෙදවුම්වල ගුණාත්මකභාවය තහවුරු කිරීම හා මිල පාලනය සඳහා රාජ්‍ය යාන්ත්‍රණයක් සකස් කරනු ලැබේ.

- කාබනික පොහොර හා මිනිසාට හිතකර ජෛව තාක්ෂණයේ යොදාගැනීම් ප්‍රවර්ධනය කරනු ලැබේ.

- කෘෂි නිෂ්පාදනවල මිල උච්චාවචනය පාලනය කිරීම අරමුණුකරගත් "ජාතික වගා සැලැස්මක්" සකස් කොට ක්‍රියාවට නගනු ලැබේ.

- වී මිලදී ගැනීම සඳහා රාජ්‍ය දායකත්වය ඉහළ දමන අතර මිල තීරණය කිරීමේ සූත්‍රයක් හඳුන්වාදීම, වාර්ෂිකව ස්ථාවර මිල ප්‍රකාශ කිරීම හා මිල සඳහා නීතිමය ආවරණයක් ස්ථාපිත කෙරේ.

- පසු අස්වනු නාස්තිය අවම කිරීම අරමුණු කරගනිමින් අස්වනු නෙලීම, ඇසුරුම්කරණය, ප්‍රවාහනය, ගබඩාකරණය, විද්‍යාත්මක පර්යේෂණ, ක්‍රියාමාර්ග හා පහසුකම් සකස් කෙරේ.

- කෘෂි තාක්ෂණය හා දියුණු කළමණාකරණය ගොවි ජනතාව වෙත ගෙනයාම සඳහාත්, ඵලදායීතාවය වැඩිකිරීම සඳහාත් ඉවහල්වන ගොවිපොළ පද්ධතියක් ඇති කෙරේ.

- ගොවි ජනතාවට උසස් සංස්කෘතික ජීවිතයක් උරුම කරදීම හා විශ්‍රාමික ගොවි ජන ජීවිතය සුරැකීම රජයේ ප්‍රමුඛතම කාර්යභාරයක් බවට පත් කරනු ලැබේ.

**පශු සම්පත්**

- පශු සම්පත් නිෂ්පාදනයට දායක වන සියලුම පරිමාණයේ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන පිරිවැය අවම වනු පිණිස මෙන්ම ඔවුන්ව දිරි ගැන්වීම උදෙසා කිරි, බිත්තර හා මස් නිෂ්පාදනයෙහි විවිධ අවධි හා බැඳුණු අභියෝග ඉලක්කකරගත් ව්‍යාපෘති ජාලයක් එකී ව්‍යවසායකයින් උදෙසා සැලසුම් කර ක්‍රියාත්මක කරවීමට රජයේ ආයතන මෙහෙය වනු ලැබේ.

- කිරි, බිත්තර හා මස් නිෂ්පාදන වෙළෙඳපොළ මිලෙන් වැඩිම ප්‍රතිශතයක හිමිකම නිෂ්පාදකයන්ට ලබාගැනීමට හැකිවන පරිදි මෙන්ම තම කර්මාන්ත හා නිෂ්පාදන පිළිබඳ ජාතික ප්‍රතිපත්තීන්ටද බලපෑ හැකි සත්ව නිෂ්පාදකයන් ඇතුළත් ගොවි අධිකාරියක් පිහිටුවීම සඳහා රාජ්‍ය ආයතන මෙහෙයවනු ලැබේ.

- නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය ඇතුළුව සමස්ත පශු සම්පත් නිෂ්පාදනය සමාජයට හිතකරවන සේ පවත්වාගෙන යෑමට හැකිවන පරිදි මෙහෙයවීමට පශු මහජන සෞඛ්‍ය අධිකාරියක් පිහිටවනු ලැබේ.

### ඉඩම්

- ඉඩම් පරිභෝජනය පිළිබඳ කඩිනම් විද්‍යාත්මක ගවේෂණයක් සිදු කෙරේ.

- ජනාවාස, කෘෂිකාර්මික පොදු ඉදිකිරීම්, කර්මාන්ත, පාරිසරික පද්ධති, වෙනත් පොදු පාරිසරික වුවමනාවන් වාරිමාර්ග හා ජලාශ යනාදිය පිළිබඳව දිගු කාලීන සැලැස්මක් සහිත පුළුල් ඉඩම් ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.

- පදිංචියට ඉඩමක් නොමැති සෑම පුරවැසියෙකුටම ඉඩමක් ලබාදීමට කටයුතු කෙරේ.

- විදේශිකයන්ට හා විදෙස් සමාගම්වලට ඉඩම් විකිණීම වහාම නතර කෙරේ.

### ජලය

- ජල සම්පත විකිණීම සඳහා වූ ක්‍රියාවලිය හා ඒ සදහා වූ ආයතන අහෝසි කරේ. ජලාශ, සංචාරක ව්‍යාපාර වෙනුවෙන් බදු දීම නවතාලනු ලැබේ.

- ජලාශ කෘෂිකර්මාන්තය හා මිනිස් පරිභෝජනය මූලික ඉලක්ක බවට පත්කොට විද්‍යාත්මක ජල කළමනාකරණයක් ක්‍රියාවට නගනු ලැබේ.

- ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීමත් හා විනාශ කොට ඇති ජල පෝෂක ප්‍රදේශ යථාවත් කිරීමත් සිදුකරනු ලැබේ.

- මහා වාරි මාර්ග ව්‍යාපාර, සුළු හා මධ්‍යම පරිමාණ වැව් පද්ධති ප්‍රතිසංස්කරණය සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

## 04. ධීවර හා ජලජ කර්මාන්ත

- ධීවර ප්‍රජාව සමාජයීය, සංස්කෘතික හා අධ්‍යාපනික ලෙස නගාසිටුවීමට කඩිනම් පියවර ගනු ලැබේ.

- ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාවේ ඇති ජලජ ජීවී සම්පත් පිළිබඳව විධිමත් සමීක්ෂණයක් සිදුකෙරේ.

- මත්ස්‍ය සහ ජලජ පැලෑටි ආශ්‍රිත ආහාර නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලා ආරම්භ කෙරේ.

- මුහුදේදී සිදුවන ස්වාභාවික විපත් කල්තියා දැනුවත් කිරීම සඳහා වරාය, නැංගුරම් තොටුපොළ හා තොටුපොළ මට්ටමේ ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීම සහ ධීවර යාත්‍රාවලට දියුණු තාක්ෂණික මෙවලම් ලබාදීමට කටයුතු කෙරේ.

- විදෙස් ධීවර යාත්‍රා මගින් සිදුවන ධීවර ආක්‍රමණය සම්පූර්ණයෙන් වැළැක්වීමට කටයුතු කෙරෙන අතර මෙරට ධීවරයන්ට අවශ්‍ය ආරක්ෂාව සැලසීමට කටයුතු කෙරේ.

- මිරිදිය ධීවර කර්මාන්තය නගාසිටුවීමට අවශ්‍ය උපකාරක සේවාවන් නගාසිටුවීමට කටයුතු කෙරේ.

## 05. වැවිලි කර්මාන්තය

- තේ, රබර්, පොල් නිෂ්පාදනය හා ඒවා ආශ්‍රිතව කර්මාන්ත නව තාක්ෂණය හා දියුණු කළමනාකරණය යොදාගනිමින් නවීකරණයට හා කාර්මීකරණයට ලක් කෙරේ.

- තේ නිෂ්පාදනය, රබර් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන ඉහළ ගුණාත්මකභාවයකින් යුක්තව සිදුකෙරෙන අතර ඒවා සඳහා විදේශ වෙළෙඳපොළ පුළුල් කර ගැනීමට වෙළෙඳ තානාපති සේවාව ශක්තිමත් කෙරේ.

- පෞද්ගලීකරණයෙන් පසුව තවදුරටත් ඵලදායීතාවය හා නිෂ්පාදනය වර්ධනයවී නොමැති මහා පරිමාණ තේ, රබර්, පොල්, වතු පිළිබඳ විමර්ශනයක් සිදුකොට නව කළමනාකරණයක් යටතට පත් කෙරේ.

- වතු ක්ෂේත්‍රයේ රැකියාවල නියුතු ජනතාවගේ රැකියා සුරක්ෂිත කිරීම, එම ජනතාවට උසස් ජීවන තත්වයක් හා ඉහළ සංස්කෘතික ජීවිතයක් උරුම කරදීම, විශ්‍රාමික ජනතාව සුරැකීම රජයේ ප්‍රමුඛතම කාර්යයක් බවට පත් කෙරේ.

## 06. සංචාරක කර්මාන්තය

- සංචාරක ව්‍යාපාරය පිළිබඳව විෂය දැනුම ඇති බුද්ධිමතුන්ගෙන්ද, පුරාවිද්‍යාඥයන්ගෙන්ද, පරිසරවේ-දීන්ගෙන්ද, සංචාරක කර්මාන්තය පිළිබඳ අත්දැකීම් සහිත වෘත්තීයවේදීන්ගෙන් ද සමන්විත සංචාරක සැලසුම් මණ්ඩලයක් ස්ථාපිත කෙරේ.

- රටේ සංස්කෘතික වටිනාකම්, ආචාරධර්ම හා ස්වාභාවික දායාදයන් ආරක්ෂා වන පරිදි හා දේශීය විදේශීය සංචාරක ප්‍රජාව ආකර්ෂණය කරන පරිදි වෙරළ ආශ්‍රිතව, කඳුකරයේ වනෝද්‍යාන ආදී වශයෙන් වන පාරිසරික කලාප සහ පුරාවිද්‍යාත්මක සංචාරක කලාප වෙන්කර ඒවාට ඇතුළත් වන තෝරාගත් විශේෂ සංචාරක මධ්‍යස්ථාන වැඩිදියුණු කෙරෙන අතර, ඒවා ආශ්‍රිත ප්‍රාදේශීය කර්මාන්ත හා හස්ත කර්මාන්ත වැඩිදියුණු කිරීමටත් වෙළඳපොළවල් ඇති කිරීමටත් පියවර ගැනේ.

- සංචාරක කර්මාන්තයට අදාළ රැකියා ඉහළ වෘත්තීය නිපුණත්වයක් සහිත ඒවා බවට ඉහළ දැමීම සඳහා පාඨමාලාවන් සහිත මධ්‍යස්ථානයක් ආරම්භ කෙරේ.

## 07. පරිසරය

- ස්වාභාවික සම්පත් සහ පරිසරය ජාතික අවශ්‍යතාවයන්ට අනුව සංරක්ෂණය හා කළමණාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කෙරෙන අතර දැනට පවතින පරිසරයට අදාළ පනත් හා රෙගුලාසි සමාලෝචනය කොට ශක්තිමත් කෙරේ.

- පරිසරය, ජලය, භූමිය දූෂණයට එරෙහිව දැඩි නීති ක්‍රියාත්මක කෙරේ.

- ජලය අපවිත්‍රකරණය වළක්වාලීමට විධිමත් රාජ්‍ය යාන්ත්‍රණයක් ස්ථාපිත කෙරෙන අතර ජලය අපවිත්‍රකරණය ලක්කරන්නන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

- ඉඩම් හා පස සංරක්ෂණය කෙරේ.

- බහුජාතික සමාගම් හා දේශීය තැරැව්කරුවන් එක්ව් සිදුකරන මහා පරිමාණ ජාන සම්පත් මංකොල්ලය නතර කිරීමට අවශ්‍ය නෛතික හා පරිපාලන ප්‍රතිසංස්කරණ සකස් කෙරේ. එමෙන්ම දැනටමත් අප රටට පමණක් ආවේණික ජාන සම්පත් තම අයිතියට හිමි කරගෙන සිටින ජාත්‍යන්තර සමාගම් මගින් ඒවා ලබාගැනීමට අවශ්‍ය රාජතාන්ත්‍රික පියවර ගනු ලැබේ.

## 08. දේශීය හා විදේශීය වෙළඳාම

- ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීමේ සභාව යටතේ ජාතික වාණිජ මෙහෙයුම් මණ්ඩලයක් පත්කෙරේ.

- කඩිනම් ආර්ථික සංවර්ධනයේ ඉලක්ක සපුරා ගැනීම අරමුණු කරගත් අපනයන ආනයන ප්‍රතිපත්තියක් සකස් කෙරෙන අතර ස්ථාවර ආනයන බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කෙරේ.

- විදේශ වෙළඳපොළෙන් නිෂ්පාදන ආනයනය කිරීමේදී සමාන්තර දේශීය නිෂ්පාදන සඳහා වූ වෙළඳපොළ ආරක්ෂා කෙරේ.

- ඖෂධ, අත්‍යාවශ්‍ය ආහාර ආදිය හිඟයකින් තොරවද, ගුණාත්මකභාවය රැකෙන පරිදිද බෙදා හැරීමටද, සාධාරණ ලෙස වෙළඳාමටද රජය මැදිහත් වේ.

## 09. මූල්‍ය ක්ෂේත්‍රය

- විනිමය පාලන කටයුතු, කොටස් වෙළඳපොළ හා රජයේ ප්‍රධාන මූල්‍ය ක්‍රියාවලි රටේ ආර්ථික සුරක්ෂිතභාවය හා මූල්‍ය ස්ථාවරභාවය ආරක්ෂා වන පරිදි නියාමනය කිරීමට අවශ්‍ය නෛතික හා පරිපාලන පියවර ගනු ලැබේ.

- රාජ්‍ය බැංකු ඇතුළු සියලු මහජන උපයෝගීතා ආයතන පෞද්ගලීකරණය නොකෙරේ.

- සරල හා සාධාරණ නව බදු ක්‍රමයක් ක්‍රියාත්මක කෙරේ.

- ශ්‍රී ලංකාවේ ආර්ථික සැලසුම්වල සැබෑ අවශ්‍යතා අනුව පමණක් ණය ලබා ගැනීමට කටයුතු කෙරේ.

- ශ්‍රී ලංකාව ලබාගෙන ඇති දැවැන්ත ණය කපාහැරීම සහ වෙනත් සහන  ලබාගැනීම සඳහා සාකච්ඡා ආරම්භ කෙරේ.

## 10. විදේශ රැකියා

- දැනට සිදුවන ආකාරයට නුපුහුණු ශ්‍රමිකයන් විදේශ සේවාව සඳහා වෙනත් රටවල්වලට යැවීම ක්‍රම ක්‍රමයෙන් අඩුකරන අතර ඉලක්ක සහගත වැඩපිළිවෙළක් මත ගොඩනැගුණු වෘත්තීයමය හැකියාව සහිත පුද්ගලයන් විදේශ රැකියා සඳහා යොමු කෙරේ.

## 11. යටිතල පහසුකම්

### බලශක්තිය

- බලශක්තිය පිළිබඳව මේ වනවිටත් ශ්‍රී ලංකාව විදේශයන් සමඟ එළඹ ඇති ගිවිසුම් ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය ආරක්ෂා කිරීම හා ජාතික අවශ්‍යතා සපුරාලීම අරමුණු කරගනිමින් සමාලෝචනයට භාජනය කෙරෙන අතර ඒවා සංශෝධනය කිරීමට හෝ අහෝසි කිරීමට කටයුතු කෙරේ.

- බලශක්තිය, ආර්ථික ක්ෂේත්‍රයට මෙන්ම ජන ජීවිතයට අතිශයින්ම වැදගත් ලෙස සලකා බලශක්ති අර්බුදය විසඳීමට පියවර ගනු ලැබේ.

- සුළං බලය, සූර්ය තාපය ඇතුළු පුනර්ජනනීය බලශක්ති පද්ධතියක් ගොඩනැගීමට පියවර ගනු ලැබේ.

- ප්‍රවාහනය, ගොඩනැගිලි ඉදිකිරීම් හා සෙසු ක්ෂේත්‍ර තුළදී බලශක්ති සංරක්ෂණය අත්‍යාවශ්‍ය අරමුණක් සේ සලකා නීති සම්පාදනය කෙරේ.

- තෙල් හා ගෑස් සම්පත් ගවේෂණය හා කැණීම් කටයුතු සඳහා දැනට පවතින ක්‍රියාවලි සමාලෝචනය කර ඒවා රටට හිතකර පරිදි සංශෝධනය කෙරේ.

- තෙල් හා ගෑස් නිෂ්පාදන කටයුතු කඩිනම් කෙරේ.

**ප්‍රවාහනය සහ මහාමාර්ග**

- රටේ සිදුකළ යුතු කාර්මීකරණයට අනුරූපී වන පරිදි ඵලදායී මාර්ග පද්ධතියක් ඉදිකෙරේ.

- මගී හා භාණ්ඩ ප්‍රවාහනයට ආර්ථික ක්‍රියාවලියේ ඉතා වැදගත් තැනක් හිමිවන බව පිළිගන්නා අතර, එය ජනතාව හෙම්බත් නොවන අයුරින් මෙහෙයවීමට රජයට ඇති වගකීම ඉටුකිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික ප්‍රවාහන සේවා නඟා සිටුවීමට කඩිනම් වැඩපිළිවෙළක් දියත් කෙරේ.

- මගී ජනතාවට උපරිම ඉහළ සේවයක් ලබාදීම එහි ප්‍රමුඛතාවය ලෙස පිළිගනිමින් මගී ප්‍රවාහනය කාර්යක්ෂම ලෙස මෙහෙයවන මගී ප්‍රවාහන අධිකාරියක් පිහිටුවනු ලැබේ.

- මගී ප්‍රවාහනයට ප්‍රමුඛතාවයක් ලැබෙන පරිදි නාගරික ප්‍රදේශයන්හි ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග නීති සකස් කෙරේ.

- දුම්රිය සේවාව කඩිනම් පූර්ණ ප්‍රතිසංවිධානයකට ලක්කර එය මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා පුළුල් කෙරේ.

- දුම්රිය හා බස් සේවා අවශ්‍යතාවය අනුව ඒකාබද්ධ කෙරේ.

- සංචාරක කලාප ඒකාබද්ධ කරමින් බස්, දුම්රිය, නාවික හා ගුවන් ප්‍රවාහන සේවා පුළුල් කෙරේ.

- මහජනතාව ආර්ථික ක්‍රියාවලියට දායක කර ගැනීමට ප්‍රමුඛතාව දෙමින් නව මාර්ග ඉදිකිරීම, දැනට පවතින මාර්ග අලුත්වැඩියා කිරීම හා පළල් කිරීම සඳහා කඩිනම් වැඩපිළිවෙළවල් දියත් කෙරේ.

- මගී ප්‍රවාහනය සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා මුහුද හා අභ්‍යන්තර ජල මාර්ග යොදා ගනු ලැබේ.

# සාධාරණ
# සමාජයක්

සමාජයක යහපැවැත්ම සඳහා **ආර්ථික සමෘද්ධිය** හා **සමාජ සාධාරණය** අත්‍යවශ්‍ය අංග දෙක වේ. **නවීන සමාජවාදී** රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණය වන්නේ, සමාජ සාධාරණත්වය, සමානත්වය, යුක්තිය ඉටු කිරීම හා ජන ජීවිතයේ යහපැවැත්මට අවශ්‍ය ආර්ථික සමෘද්ධිය අත්පත් කර ගැනීමය. ආණ්ඩුව, පෞද්ගලික සමාගම්, ආයතන හා සංවිධාන, පවුල හා පුද්ගලයා යන සමාජ සංවිධාන හතරම සාධාරණ සමාජයක් ගොඩනැංවීම වෙනුවෙන් අන්තර් සම්බන්ධිතව මෙහෙයවිය යුතුය. මෙම අරමුණ ඉටු කර ගැනීමට හැකි වන පරිදි පුළුල් හා සාධාරණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය, රටේ මානව හිමිකම් හා මූලික අයිතීන්, නෛතික හා අධිකරණ ක්ෂේත්‍ර, පාරිභෝගික ආරක්ෂණ ආයතන, මුල්‍ය හා මහජන උපයෝගිතා පිළිබඳ ක්ෂේත්‍ර ආදිය සමාජ සාධාරණත්වය උපරිම වශයෙන් රකිමින් පහත සඳහන් පරිදි පෙරළිකාර වෙනස්කම්වලට ලක් කළ යුතුය.

## 01. ආණ්ඩුවේ කාර්යභාරය

### මූලික මිනිස් අයිතීන්

- ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ ගිවිසුම් හා මානව හිමිකම් පිළිබඳ ප්‍රඥප්ති පිළිගෙන ඒවාට පටහැණි නොවන සේ පුරවැසි අයිතීන් ආරක්ෂා කර තහවුරු කිරීම සඳහා නීති සම්පාදන කෙරේ.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් කම්කරු, ගොවි, තරුණ, ශිෂ්‍ය, කාන්තා, ළමා, වැඩිහිටි හා හැකියාව සීමිත බවට පත්ව ඇති පුරවැසියන් ඇතුළු සියලු පුරවැසියන්ගේ අයිතීන් ආරක්ෂා කෙරේ.

● සියලු පුරවැසියන්ට තොරතුරු දැනගැනීමේ අයිතිය සහතික කෙරේ.

**අධිකරණය**

● යල් පැනගිය පැරණි නීති වෙනුවට නූතන තත්වයන්ට ගැලපෙන පරිදි නීති පද්ධතිය සකස් කරනු ලැබේ.

● අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කරනු ලැබේ.

● නීති ආධාර දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කෙරේ.

● මූලික අයිතීන් උල්ලංඝනය කිරීම් පිළිබඳව රජයට එරෙහිව පමණක් නොව පෞද්ගලික අංශයට හා වෙනත් ආයතනවලට එරෙහිවද අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමේ අයිතිය පුරවැසියන්ට හිමි කෙරේ.

**අපරාධ හා බන්ධනාගාර**

● අපරාධ වැළැක්වීම සඳහා යොමුවූ කඩිනම් අධ්‍යාපන හා දැනුවත් කිරීමේ ජාතික ව්‍යාපාරයක් ආරම්භ කෙරේ.

● සමාජ ආරක්‍ෂණය අහිමිවීම නිසා පුද්ගලයින් අපරාධවලට පෙළඹෙන බව පිළිගෙන අපරාධ වැළැක්වීම සඳහා ලැබිය යුතු අයට සමාජ ආරක්‍ෂණය සහතික කෙරේ.

● අපරාධවලට වැරදිකරුවන් වන සියලු දෙනා යහපත් පුරවැසියන් බවට පත්කිරීම සඳහා වූ පුනරුත්ථාපන හා අධ්‍යාපන මධ්‍යස්ථාන, බන්ධනාගාරවලට අනුබද්ධව පිහිටුවනු ලැබේ.

● රැඳවියන්ට වෘත්තීය පුහුණුව හා උසස් අධ්‍යාපනය ඇතුළුව වැඩිදුර අධ්‍යාපනය ලබාදීම සඳහා අවශ්‍ය පහසුකම් සලසනු ලැබේ.

**කාන්තා හා ළමා අයිතිවාසිකම්**

● කාන්තාවන් පීඩාවට ලක්කරන සමාජ අසමානතාවයන්, පීඩාවන් වෙනස්කම් කිරීම හා බාධාවන් අහෝසි කරන අතර සෑම ක්ෂේත්‍රයකම කාන්තාවන්ට පිරිමි හා සම අයිතිවාසිකම් සහතික කෙරේ.

● නීතිය ඉදිරියේදී මෙන්ම සම්ප්‍රදායයන් හා සමාජ ආකල්ප ඉදිරියේදී කාන්තාවන්ගේ ගරුත්වය හා සමාන අයිතීන් තහවුරු කෙරේ.

● විවාහ ජීවිතය තුළදී කාන්තාවන් මුහුණ දෙන ගැටලු සහ අසමානතාවය අහෝසි කිරීම සඳහා දැවැදි ක්‍රමය තහනම් කෙරේ. දරුවන් ලැබීම පිළිබඳ තීරණ ගැනීමේ පූර්ණ අයිතිය කාන්තාවන් සතු කෙරේ.

● පාසල් අධ්‍යාපනය ලැබීමේ අනිවාර්ය වයස් සීමාව අවුරුදු 16 දක්වා වැඩි කෙරෙන අතර වයස 16ට අඩු දරුවන් රැකියාවල නිරත කිරීම සපුරා තහනම් කෙරේ.

● ළමා හිංසනය හා අපයෝජන වැළැක්වීමට අවශ්‍ය පරිපාලන හා සමාජයීය ප්‍රතිසංස්කරණ සිදුකරන අතර ඒවා උල්ලංඝනය කරන්නන්ට එරෙහිව නීති මඟින් කටයුතු කෙරේ.

● ළමා ඖෂධ, ළමා පොත්පත් හා අධ්‍යාපන උපකරණ සියලු බදුවලින් නිදහස් කෙරේ.

**සමාජ සුභසාධනය**

● සමාජයීය රැකවරණය ලැබිය යුතු සියලු පුරවැසියන් වෙනුවෙන් සමාජ ශුභ සාධනය හා පුනරුත්ථාපනය සඳහා පූර්ණ බලැති අධිකාරියක් පිහිටුවනු ලැබේ.

● සමාජ ශුභ සාධනය සඳහා අවශ්‍ය සියලු මූල්‍ය ප්‍රතිපාදන රජය මගින් සපයනු ලැබේ.

● රටේ සියලුම පුරවැසියන්ගේ ජීවන තත්ත්වය පිළිබඳව පූර්ණ සමීක්ෂණයක් සිදුකර ජීවන තත්ත්වය නඟා සිටුවිය යුතු පුරවැසියන් සියලු දෙනාගේ පවුල්වලට ප්‍රමාණවත් සහන ලබාදීමට කටයුතු කෙරේ.

● දෙමාපියන් නොමැති දරුවන්, දෙමාපියන් රැක බලාගත නොහැකි දරුවන්, කාත් කවුරුත් නැති විශ්‍රාමික වැඩිහිටියන්, මත්ද්‍රව්‍යවලට අබ්බැහිවූවන්, බාල අපරාධකරුවන්, ගණිකාවන් ආදීන් රැකබලා ගැනීමට හා පුනරුත්ථාපනය කිරීමට කටයුතු කෙරේ.

● ආබාධිත පුරවැසියන්ට සෙසු පුරවැසියන් මෙන්ම, රටට සේවය කිරීම සඳහා යොදා ගැනීමට කටයුතු කෙරේ.

**නාස්තිය දූෂණය හා වංචා වැළැක්වීම**

● ශ්‍රී ලංකාවේ මෙතෙක් සිදුකර ඇති දූෂණ හා වංචා පිළිබඳව පරීක්ෂා කිරීමටත්, ඒවාට වගකිවයුත්තන්ට දඬුවම් කිරීම සඳහාත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ගෙන් සමන්විත කොමිසමක් පත් කෙරේ.

● දූෂණ හා වංචා පිළිබඳව වැරදිකරුවන් වන්නන්ට දැඩි දඬුවම් පැනවීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කර සම්මත කෙරේ.

## 02. පෞද්ගලික සමාගම්වල හා ආයතනවල කාර්යභාරය

සාධාරණ සමාජයක් ගොඩනැංවීමේදී, අන් අයගේ අයිතීන් හා අවස්ථා අහිමි, පෞද්ගලික සමාගම් හා ආයතන විසින් සිදුකරනු ලබන අධිපතිවාදී ප්‍රවේශයන් හා ක්‍රියාවන් නතර කළ යුතුය. ඒ සඳහා,

- මූලික අයිතීන් උල්ලංඝනය වීමේදී පෞද්ගලික ආයතන හා සංවිධාන ආවරණය වන පරිදි නෛතික විධිවිධාන සකස් කෙරේ.

- විශාල මූල්‍ය මාධ්‍ය හෝ පිරිස් බලයක් ඇති සමාගම්වලින් ආයතනවලින් සිදුවිය හැකි අධිපතිවාදී ක්‍රියාකාරකම් සීමා කෙරෙන රෙගුලාසි හා ආචාරධර්ම පද්ධතියක් සකස් කෙරේ.

- ජන ජීවිතයට පුළුල් ලෙස බලපාන ආර්ථික, මූල්‍ය හා සංස්කෘතික ක්ෂේත්‍රවල ඒකාධිකාරයන් ගොඩ නැගීමට නොහැකිවන සේ නීති හා රෙගුලාසි සකස් කෙරේ. එවැනි සමාගම් හා ආයතන පාර්ලිමේන්තුවට වගකියන ආකාරයෙන් ව්‍යවස්ථා ප්‍රතිපාදන ඇති කිරීම මගින් සමාජයේ සාධාරණ පැවැත්ම සහතික කෙරේ.

## 03. පවුල සහ පුද්ගල කාර්යභාරය

සමාජ සාධාරණය සහිත සමාජයක් ගොඩනැංවීමේ දී පවුල තුළද එම සාධාරණත්වයේ මූලධර්ම ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය වේ. ගෘහස්ථ හිංසනය, කාන්තා හිංසනය, ළමා හිංසනය, විශේෂයෙන් කාන්තාවන්ට විවාහය, රැකියාව හා සංස්කෘතිය භුක්ති විඳීම හා සමානයන් ලෙස ජීවිතය පවත්වාගෙන යාමට බාධාකාරී වන හිංසාකාරී, අසාධාරණ හා පීඩාකාරී තත්ත්වයන් පවුල තුළින් සිදුවීම නතර කිරීම අත්‍යවශ්‍ය වන අතර, සාධාරණ සමාජයක් ගොඩනැංවීමේ අරමුණ ජය ගත හැක්කේ, පවුල් ඒකකවලට ඒ සඳහා වගකීම ඉටු කිරීම තුළින්ද වේ. එමෙන්ම තනි තනි පුරවැසියාටද සාධාරණ සමාජයක් ගොඩනැංවීමේ ක්‍රියාවලියට දායක වීම අනිවාර්ය වගකීමක් වේ.

# නිවහල්
# මිනිසෙක්

**නවීන සමාජවාදී** සමාජයක මුඛ්‍ය පරමාර්ථය වන්නේ නිවහල් මිනිසකු ගොඩනැඟීමයි. මෙහි අරමුණ වන්නේ තමා ගැන හා තම රට ගැන ස්වාභිමානයෙන් යුත්, තම යුතුකම්, වගකීම් හා අයිතීන් ගැන දන්නා, සිය නිදහස හා ආරක්ෂාව පිළිබඳ දැඩි විශ්වාසයෙන් යුත්, උගත් හා සංවේදී මනසක් ඇති තෘප්තිමත් පුද්ගලයකු බිහි කිරීමය. නිවහල් මිනිසකු යනු ආර්ථික වශයෙන් සමෘද්ධිමත් පුද්ගලයකු පමණක් නොවේ. වත්මන් සමාජය තුළ මුදල් යහමින් තිබෙන පුද්ගලයා පවා එම දේපළ සොර සතුරු තර්ජන හා කප්පම් දීම් නිසා අහිමි වේය යන පීඩාවෙන් දිවි ගෙවයි. මුදල් හදල් නොමැති පුද්ගලයා ඒවා නොමැතිකමේ පීඩාවෙන් දිවි ගෙවයි. මේ නිසා වත්මන් සමාජය තුළ මිනිසුන් සියලුම දෙනා අතෘප්තිමත්කමට, වෙහෙසට හා පීඩාකාරීත්වයට ලක්වී තිබේ. පරත්වාරෝපණයට ලක් වී තිබේ. මුල්‍ය බලයේ සුළියට හසු වී තිබේ. එවන් සමාජයක කිසිවකු නිවහල් මිනිසකු නොවේ.

පාසල් හා සරසවි අධ්‍යාපනයද, සංස්කෘතික හා කලා ක්ෂේත්‍රයද ඉහත අරමුණින් යළි සංවිධානය කළ යුතුය. අප රටේ අතීත පරම්පරාවන් විසින් දායාද කර ඇති යහපත් භෞතික හා ආධ්‍යාත්මික උරුමයන් පිළිබඳ අගයීමක් ඇති අය බවට පත් කිරීමට එම ක්ෂේත්‍රයන් මෙම අරමුණට මෙහෙයවිය යුතු ය. එමෙන් ම ලොව අන්‍ය ජාතීන් හා ජනතාවන්ගේ නිදහස හා ස්වෛරීත්වය ගරු කරන පුද්ගලයකු ගොඩනැඟීම උදෙසා ජනමාධ්‍ය හා පොදු ජන කටයුතු මෙහෙයවිය යුතුය. මේ ලක්ෂණවලින් යුත් නිවහල් මිනිසෙකු ගොඩනැඟීම වෙනුවෙන් අධ්‍යාපන, සංස්කෘතික හා කලා, නෛතික ප්‍රතිසංස්කරණ, ජනමාධ්‍ය හා සදාචාරය වැනි ක්ෂේත්‍ර එම අරමුණට අනුව සකස් කළ යුතු ය.

- සෑම පුරවැසියෙකුම උසස් රසවින්දනයෙන් යුක්ත වූවෙකු බවට පත්කිරීම රජයේ ප්‍රමුඛ කාර්යභාරයක් ලෙස සලකා කටයුතු කෙරේ.

● සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවගේ කලා හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කර පෝෂණය කරන අතර, ඒවා මගින් ජනතාව අතර මිත්‍රත්වය, සහෝදරත්වය හා සමගිය ගොඩනැගීම සඳහා කටයුතු කෙරේ.

● කලාකරුවාගේ ආත්ම ප්‍රකාශනය සඳහා වන අයිතිය හා පුරවැසියාට එම කලා නිර්මාණ රසවිඳීමට ඇති අයිතිය සුරක්ෂිත වන පරිදි ඒ පිළිබඳ ජාතික ප්‍රඥප්තියක් සකස් කෙරෙන අතර ඒ සඳහා ක්ෂේත්‍රයේ නියුතු වූවන්ගෙන් සමන්විත මණ්ඩලයක් පත් කෙරේ.

● කලා නිර්මාණ සඳහා අවශ්‍ය වන රංග ශාලා, කලාගාර ඇතුළු යටිතල පහසුකම් නිර්මාණය කරන අතර පාසල් හා ග්‍රාමීය මට්ටමේ සිටම දක්ෂ කලාකරුවන් හඳුනාගෙන ඔවුන් ජාතික හා ජාත්‍යන්තර මට්ටමට ගොඩනැංවීමට අවශ්‍ය පුළුල් යාන්ත්‍රණයක් ස්ථාපිත කරනු ලැබේ.

● සියලු කලා උරුම හා කලා නිර්මාණ සංරක්ෂණය කිරීමේ විද්‍යාත්මක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.

● සමාජයේ උන්නතිය වෙනුවෙන් රාජ්‍ය හා පෞද්ගලික ජනමාධ්‍ය සංස්කෘතිය විප්ලවීය වෙනසකට භාජනය කොට ඒවා රජයේ හෝ බලධාරීන්ගේ හෝ වෙනත් අයගේ මතවාදයන් ජනතාව මත පටවන නොදියුණු තත්වයෙන් මුදා ගනු ලැබේ.

● දරුවන්ගේද පොදුවේ පුරවැසියන්ගේද අධ්‍යාපනය, සාහිත්‍ය හා කලා රසවින්දනය, නව තොරතුරු හා ප්‍රවෘත්ති දැන ගැනීම යන අරමුණු වෙනුවෙන් ප්‍රධාන වශයෙන් ජනමාධ්‍ය යොදාගැනීමට කටයුතු කෙරේ.

● පුරවැසි අයිතිය හා මාධ්‍ය වගකීම පිළිබඳව දැනට පවතින විසංවාදයන් පිළිබඳව සලකා බලා ඊට අදාල ප්‍රඥප්තියක් සකස් කිරීම සඳහා මාධ්‍යවේදීන්, මාධ්‍ය හිමියන් හා පුරවැසි නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට කටයුතු කෙරේ.

● ශ්‍රී ලංකාවේ ඓතිහාසික උරුමයන් වූ පෞරාණික ස්ථාන හා භාණ්ඩ සංරක්ෂණය කිරීම, ඒවායේ තිරසාර පැවැත්ම තහවුරු කිරීම හා අනාගත පරපුර උදෙසා ඒවා ජාතික උරුමයන් ලෙස සුරැකීම රජයේ ප්‍රමුඛ වගකීමක් ලෙස සලකා කටයුතු කෙරේ.

● පුරාවස්තු වැනසීමේ අපරාධකාරී ක්‍රියාවලිය වහාම නතර කිරීමට පියවර ගනු ලැබේ.

● **නවීන සමාජවාදී** රාජ්‍යයක් තුළ නිවහල් මිනිසෙක් ගොඩනැගීම සමඟ ලෝකයේ අභිමානවත් නිවහල් ජාතියක් ලෙස ශ්‍රී ලංකාව නගා සිටුවීම වෙන්කළ නොහැකි පරිදි බැඳී පවතී. ඒ අනුව අධිරාජ්‍යවාදී දේශපාලන, ආර්ථික හා සංස්කෘතික ආක්‍රමණවලින් මාතෘභූමිය ආරක්ෂා කරගැනීමත් ජනතාවගේ පරමාධිපත්‍ය බලය හා රටේ ආර්ථික, දේශපාලන, සමාජීය හා සංස්කෘතික ස්වෛරීත්වය ඉහළින්ම පවත්වාගෙන යෑමත් රටේ ගරුත්වය හා කීර්තිනාමය කිසි ලෙසකින් හෝ කෙළෙසීමට ඉඩ නොදීමත් ශ්‍රී ලාංකේය ජාතිය සතු හැකියාවන් හා වටිනාකම් පිළිබඳව ස්වාභිමානයෙන් පිරුණු පුරවැසි සමාජයක් ගොඩ නැගීමත් **නවීන සමාජවාදී** රාජ්‍යයේ ප්‍රතිඥාවක් හා පරමාර්ථයක් වේ.

වර්තමානයේ ලංකාව මුහුණදී ඇති මෙම අර්බුදයට ඇත්තේ, එක සැබෑ විසඳුමක් පමණි. එනම් මෙම වැරදි සමාජය එහි ගැඹුරින්ම වෙනස් කරන නව සමාජ පරිවර්තනයකි. සැබෑ ආර්ථික සංවර්ධනය, සමාජ සාධාරණත්වය, ප්‍රජාතන්ත්‍රවාදය, ජාතික සමගිය, සැබෑ ජාතික නිදහස, පුද්ගල නිදහස, හා යහපාලනය ගොඩනැගිය හැකි සමාජයකි. එනම් වර්තමානයේ අපේ රටට ගැලපෙන, නවීන සමාජවාදී ප්‍රතිපත්ති මත පදනම් වූ, ජනතාවාදී පාලනයක් සහිත නව සමාජයකි. එවන් සමාජයක් ගොඩනැගිය හැක්කේ බොරු පොරොන්දුවලින් නොව පැහැදිලි හා ස්ථිර ප්‍රතිපත්ති මාලාවක් ක්‍රියාත්මක කිරීමෙනි.

නියමුවා ප්‍රකාශන